යම් සමාජයක් තුළ භාවිතා වන භාෂාව, එම සමාජයේ චින්තනය හැඩගැස්වීමට දායකත්වයක් සපයන බවට වන අදහස, මේ වන විට පුළුල්ව සාකච්ඡාවට ලක් වන කරුණකි. එහිදී මාධ්‍ය අතද වගකීමක් තිබෙන්නේ, ගැටළුකාරී විය හැකි යෙදුම් සමාජගත වීමට, මාධ්‍ය හසුරුවන භාෂාවද දායක වන බැවිනි.

"පෝද්දා ගවයකු සොරාගෙන මස්කළ මස් වැද්දෝ 4 ක් මාට්ටු" යනුවෙන් ලංකාදීප පුවත්පතේ නොවැම්බර් 26 දින දැක්වී ඇති සිරස්තලය ඊට නිදසුනකි.

1) මෙහි සිදුවී ඇති බවට පැවසෙන අපරාධකාරී ක්‍රියාව ඉදිරිපත් කිරීම සඳහා යොදාගැනුනා වුවත්, ඔබ සිතනා ලෙසට "මස් වැද්දෝ" වැනි යෙදුම් කෙතරම් යෝග්‍ය වන්නේ ද?

2) "මස් වැද්දෝ" වැනි යෙදුම් මාධ්‍ය තුළ භාවිතා වීම සම්බන්ධයෙන් ඔබ කෙතරම් දුරට එකඟ වන්නේ ද?

මේ පිළිබඳ ඔබේ අදහස් මොනවාද?